

## සිරිලක සසුන් කෙතට  අලුත් ඉරක්...

### ඃ සැපත සලසන සත් දන ඇසුර

– පල්ලත්තර සුමනජෝති නාහිමි

දුරුතු අමාවක පෝද ධර්ම දේශනාව යටතේ සුදනන් ඇසුරු කිරීමේ වැදගත්කම ගැන බුදු වදනකට අර්ථකථනයක්. දහම පිළිබඳ අව– බෝධයෙන් – බුද්ධියෙන් සහ යහගුණයෙන් සපිරි පුද්ගලයන් ඇසුරු කිරීම නිවන් මග තහවුරු කරන සාධකයක් වන බව, මෙම ධර්ම දේශනාවෙන් පැවසේ.

### ඃ පාසල් විෂය මාලාවට ඉතිහාස විෂය එක් කළ යුතු ය

– කුරුණෑගොඩ පියතිස්ස නාහිමි

වත්මන් පාසල් අධ්‍යාපනයේ විෂය මාලාවට ඉතිහාස විෂය – වෙනම විෂයයක් හැටියට ඇතුළත් කිරීමේ වැදගත්කම රටේ අනාගතය තීරණය කරන මතු පරපුර තුළ රටේ ඉතිහාසය පිළිබඳ මනා අවබෝධයක් තිබීමේ වැදගත්කම.

### ඃ නිදහස අර්ථවත් කරමු

– අලුත්වැව සෝරත නාහිමි

සැබෑ ලෙස "නිදහස" භුක්ති විඳීම යනු දේශපාලන, ආර්ථික හා සමාජ අභිවෘද්ධිය ජනතාව සතුවීම බව මෙම ලිපියෙන් පැහැදිලි කැරේ. එද ශ්‍රී ලංකාව ලබාගත් නිදහසෙහි උපරිම ප්‍රතිලාභ ලබන මග වන්නේ – එහි සියලු ලාභාංශ ශ්‍රී ලාංකීය සමාජයට නිසි ලෙස ලැබෙන සේ සමාජ අභිවෘද්ධිය උදා කිරීම බව.

### ඃ ජාතික කොඩිය සදහම් සංග්‍රහයකි

– නාලන්දේ විමලවංශ හිමි

ජාතික කොඩියේ විවිධ සංකේත බෞද්ධ ආගමික ඉගැන්වීම් වලට සම්බන්ධ කර සිදු කැරුණු විග්‍රහයකි. බුදු දහමේ දැක්වෙන වැදගත් කරුණු පිළිබඳ අරුත් කිහිපයක් ජාතික කොඩිය තුළින් පිළිබිඹු වන අයුරු පෙන්වා දීමට ලේඛකයා උත්සාහ දරයි.

### ඃ මග – ඵල ලැබීම සිහිනයක් නොවේ

– දෙලොස්වල උදිතධීර හිමි

මාර්ග – ඵල ඤාණ ලැබීම – වර්තමාන සමාජයේ ඇතැම් අය සිතන පරිදි බොහෝ දුෂ්කර කටයුත්තක් නොවන බවත් – ඊට අවශ්‍ය පිළිවෙත් මග බුදු වදන් තුළින් පහසුවෙන් සොයා ගත හැකි බවත් පැවසෙන ලිපි පෙළක – දෙලොස් වැනි ලිපිය.

### ඃ ගන්ධාර බෞද්ධ කලා මධ්‍යස්ථාන

'බෞද්ධ කලා නිර්මාණ' විශේෂාංගය යටතේ මෙම ලිපිය ඉදිරිපත් කැරේ. බුදු පිළිම නෙළීම පිළිබඳ කලාවේ ක්‍රමික විකාශනය පිළිබඳ ඓතිහාසික තොරතුරු කිහිපයක් බුද්ධ වර්ෂ 721 පමණ කාල– යේදී භාරතයේ විසූ කණිෂ්ක රජතුමා බුදු පිළිම කලාවෙහි අභි– වෘද්ධිය වෙනුවෙන් ඉටු කළ සුවිශේෂ මෙහෙවර පිළිබඳ තොරතුරු කිහිපයක් ද මෙම ලිපියට ඇතුළත් වී ඇත.

### ඃ මැද කීඹිය සේල චේතියාරාම විහාරය

ගාල්ල දිස්ත්‍රික්කයේ පිහිටි ඉපැරණි විහාරස්ථානයක් පිළිබඳ තොරතුරු. ගාල්ලේ සිට මාපලගම දක්වා ඇති මාර්ගයේ ගමන් කිරීමේදී හමුවන 'මැද කීඹිය' නම් වූ ප්‍රදේශයෙහි මෙම විහාරස්– ථානය පිහිටා ඇත.

### ඃ අපට පෙනෙන සහනය

– කිරිබත්ගොඩ ඤාණානන්ද හිමි

– සාකච්ඡා කොට සකස් කළේ සීසර් සුදුසිංහ

ගිහියාගේ එදිනෙද ජීවිතයේ දියුණුව සඳහා බුදු වදනෙන් ලැබෙන මග පෙන්වීම පිළිබඳ සාකච්ඡා කොට සකස් කැරුණු ලිපියකි. ඇතැම් අය කල්පනා කරන අන්දමට දහම් මගට පිවිසීමට ලෞකික දියුණුවට බාධාවක් නොවන බව – ධර්මානුකූල ලෙස පෙන්වා දීමට – සාකච්ඡාවට සහභාගි වූ හිමියෝ උත්සාහ කරති.

## ෴ බුදු දහම පෙන්වා දෙන මානව නිදහස

– මීගොඩ පඤ්ඤාලෝක හිමි

බෞද්ධ දර්ශනය මගින් අවධාරණය කැරෙන ‘පුද්ගල නිදහස’ පිළිබඳ විමර්ශනාත්මක ලිපියකි. බාහිර ලෝකයේ සිදු කැරෙන සියලු විප්ලව තුළින් ලබා ගන්නා නිදහසට වඩා – ධාර්මික ආධ්‍යාත්මික විප්ලවයක් තුළින් උදාකර ගත යුතු පරම සනාතන පුද්ගල නිදහසෙහි වැදගත්කම.

## ෴ The liberation of the individual in Buddhism

*-By Ellawala Nandisvara Nayaka Thera*

## ෴ ලක්දිව සසුන් කෙතට අලුත් ඉරක්

– ටී. ඩී. සිරිසේන

තාවකාලික පැවිද්ද සඳහා වැඩිහිටි – තරුණ දෙපිරිසක් යොමුකළ අවස්ථාවක් පිළිබඳ විස්තරයකි. බුරුමය ආදී රටවල පැවතුණ තාවකාලික පැවිද්ද ශ්‍රී ලංකාව තුළද නැවත ක්‍රියාත්මක කිරීම සඳහා වත්මන් ඇතැම් බෞද්ධ කොටස් දරන ලද ප්‍රයත්නයක් පිළිබඳ ප්‍රවෘත්ති විශ්ලේෂණයකි.